# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/8/1/62 | ඔබේ අංකය<br>உனது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2023.02.09 |

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (අයවැය) 01/2023**

සියළුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්,
ගණන් දීමේ නිලධාරීන්,
ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**2023 වසර සඳහා වෙන් කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන සියයට 6 කින් කපා හැරීම හා රජයේ වියදම් කළමනාකරණය**

උක්ත කරුණ සම්බන්ධයෙන් මුදල්, ආර්ථික, ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද අංක BD/CBP/01/01/05/2022 හා 2023.01.27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 සහ මුදල් කොමිෂන් සභාවේ ලේකම් විසින් යොමු කරන ලද අංක FC/RCA/GEN/06/01/2023 VOi.1 හා 2023.02.03 දිනැති ලිපිය ඔබගේ අවධානයට යොමු කරමි. (පිටපත් මේ සමග අමුණා ඇත).

02.ඒ අනුව, 2023 වසර සඳහා ඇස්තමේන්තුගත රජයේ දළ ආදායම රැස් කිරීම සම්බන්ධයෙන් උද්ගතව ඇති දැඩි දුෂ්කරතා හේතුවෙන් ඇතිවිය හැකි අහිතකර ප්‍රතිවිපාක අවම කිරීම සඳහා වඩාත් ඵලදායී හා අරපිරිමැසුම්දායී ලෙස රජයේ අරමුදල් යෙදවීමේ අරමුණින් 2023 වසර සඳහා අයවැය මගින් වෙන්කර ඇති පුනරාවර්තන වියදම් අවම වශයෙන් සියයට 6 කින් කපා හැරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත. ඒ අනුව, පළාත් සභාවේ සියලුම වියදම් ශීර්ෂවලට අදාලව ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්, ගණන්දීමේ නිලධාරින් විසින් පහත ක්‍රියාමාර්ගයන් අනුගමනය කළයුතු වේ.

(අ) **2023 මුදල් ප්‍රකාශය මගින් පහත වැය විෂයන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන හැර අනෙක් සියලුම පුනරාවර්තන වියදම් සඳහාවූ ප්‍රතිපාදනවල එකතුවෙන් 6 % කට සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් අවම වශයෙන් අවුරා තැබීමට කටයුතු කළ යුතුවේ.**

| | වැය විෂය විස්තරය | වැය විෂය සංකේත අංකය |
|---|---|---|
| 1. | වැටුප් හා වේතන | 1001 |
| 2. | වෛද්‍ය සැපයුම් | 1204 |
| 3. | බදුකුලී සහ පළාත් පාලන ආයතන බදු | 1404 |
| 4. | විශ්‍රාමික ප්‍රතිලාභ | 1502 |
| 5. | අත්‍යාවශ්‍ය සුබසාධන ගෙවීම් සහ ව්‍යවස්ථාපිත හෝ ගිවිසුම්ගත බැඳීම්<br>• දුෂ්කර ආර්ථික වාතාවරණ හමුවේ පීඩාවට පත් පුද්ගලයින් සඳහා සහන සැලසීම.<br>• සමෘද්ධි, වැඩිහිටි, වකුගඩු රෝගීන් සඳහා දීමනා සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා දීමනා.<br>• ගර්භනී මවුවරුන් සඳහා පෝෂණ ආහාර පැකේජය, පෙර පාසල් ළමුන් සඳහා උදෑසන ආහාරය, උග්‍ර මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන්ට පෝෂණ අතිරේකය.<br>• ත්‍රිපෝෂ වැඩසටහන, පාසල් පෝෂණ වැඩසටහන ඇතුළු පාසල් සඳහා වන සුභසාධන වැඩසටහන්. | |


ප්‍රධාන ලේකම් பிரதான செயலாளர் Chief Secretary 091 4944002 | කාර්යාලය காரியாலயம் Office 091 4119011 091 2226118 | ෆැක්ස් பெக்ஸ் Fax 091 2246299 | විද්‍යුත් තැපෑල மின் அஞ்சல் E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය இ தளம் Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.

பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

(ආ)වියදම් අවම කිරිම සඳහා හදුනාගත් ක්‍රමවේද ඇතුලත් 2023 වියදම් ඉතිරිය පිලිබඳ විස්තර ඇමුණුම 1 ආකෘතියට අනුව සකස් කර 2023.02.28 දිනට පෙර ප්‍රධාන ලේකම් කාර්යාලයේ අයවැය අංශයේ budget@cs.sp.gov.lk ඊමේල් ලිපිනය වෙත යොමු කළ වේ.

(ඇ)වියදම් අවම කිරිම සඳහා නීති රීති හා රෙගුලාසි දැඩිව පිළිපැදීම හා ඒ ඒ ආයතන වල ස්වභාවය අනුව භාවිතා කළ හැකි උපක්‍රමික ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුවේ.එසේම, පොදුවේ සියලු ආයතන විසින් පහත ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

I පවත්නා සම්පත් උපයෝගී කර ගනිමින්,ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය (Business Process Reengineering), ප්‍රශස්ත තොග කළමනාකරණය (Optimum Inventory Management), තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතය (Information Communication Technology),ඩිජිටල්කරණය (Digitalization),මාර්ගගත සේවා සැලසීම(On-line Service Delivery) ආදී ක්‍රමවේද හඳුන්වා දීම මහින් තම ආයතනයන්හි පුනරාවර්තන වියදම් අවම කිරීම සඳහා කටයුතු කළ යුතුය.

II විදුලිය,ජලය,දුරකථන සේවා,ඉන්ධන සහ අනෙකුත් ගිවිසුම්ගත සේවාවන් සඳහා වන වියදම් අවම කිරීම පිණිස උචිත වියදම් පාලන ක්‍රමවේද යොදා ගැනීම හා එම සේවා උපයෝජනය පිළිබඳව විගණනය කිරීම කළ යුතුය.එමෙන්ම, කාර්යාලීය අවශ්‍යතා මිළදී ගැනීම දැඩි පාලනයකට යටත් කළ යුතුවේ.

III වැය විෂය සංකේත 1002- අතිකාල හා නිවාඩු දින වැටුප් සහ 1003- වෙනත් දීමනා සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන අවම වශයෙන් 6 % කින් අඩු කළ යුතු බැවින් නිවාඩු දින රාජකාරි කටයුතු සඳහා සත්‍ය සේවා අවශ්‍යතාවයන් පවතින බව හා අදාල ගෙවීම් සඳහා හිමිකම් ලැබීමට සේවය කළ යුතු කාලය තුල සත්‍ය වශයෙන්ම සේවයේ යෙදෙන බව එම ගෙවීම් සඳහා බලය දෙන නිලධාරීන් විසින් අනිවාර්යයෙන්ම තහවුරු කළ යුතු නිසි අධිකාරි බලයක් නොමැතිව ආයතන මට්ටමින් අභ්‍යන්තර උපදෙස් මත ගෙවනු ලබන දීමනා නතර කළ යුතු වේ.

IV වැය විෂය සංකේත 1202 - ඉන්ධන, 1401- ප්‍රවාහන හා 1408 - මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා වාරික ගෙවීම සම්බන්ධ වියදම් දැඩි පාලනයකට යටත් කළයුතු අතර නිල වාහන හිමිකම් අනුව එක් වාහනයක් පමණක් අනුමත ඉන්ධන සීමාව තුල භාවිතා කරනු ලබන බවට හා නිල වාහන වෙනුවට ප්‍රවාහන දීමනාව ලබා ගන්නා නිලධාරීන් වෙත සංචිත වාහන නොදෙන බවට තහවුරු කරගෙන කටයුතු කිරීමට ආයතන ප්‍රධානීන් වගබලාගත යුතුය. සංචිත වාහන භාවිතයේදි මනා සැලසුමකින් යුතුව අත්‍යවශ්‍යම කටයුතු සඳහා පමණක් සීමා කිරීමටත් හැකිතාක් මාර්ගගත ක්‍රමවේද භාවිතා කර රැස්වීම්/සම්මන්ත්‍රණ/සාකච්ඡා පැවැත්වීමටත් කටයුතු කළ යුතුවේ.එමෙන්ම,කලාප/ප්‍රාදේශීය/උප- කාර්යාල මහින් පහසුවෙන් ආවරණය කළ හැකි රාජකාරි/සේවා අවශ්‍යතා වෙනුවෙන් පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් ප්‍රවාහන පහසුකම් සඳහා වියදම් දරමින් කටයුතු කිරීම අවම කළ යුතුය.

V වැය විෂය සංකේත -1501 සුභ සාධන වැඩසටහන්වල ප්‍රතිපාදන, තොරතුරු තාක්ෂණය භාවිතය, ඩිජිටල්කරණය, මාර්ගගත ක්‍රමය තුලින් හා ප්‍රතිලාභින් “ඉලක්කගත කිරීමේ කාර්යක්ෂමතාවය” ඉහල නැංවීම තුලින් ඉතිරි කිරීමට කටයුතු කළ යුතුය.

VI රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම යටතේ මාණ්ඩලික නිලධාරීන් වෙත ලබාදෙන ණය පහසුකම් සම්බන්ධයෙන් අයවැය චක්‍රලේඛ 03/2022 හි පවත්නා සීමාවන් තවදුරටත් එලෙසින්ම ක්‍රියාත්මක වේ.

VII ඉතිරි කිරීම් ගණනය කිරීමේදී වැය විෂය සංකේතාංකය අංක 1204 - වෛද්‍ය සැපයුම් නිදහස් කර ඇතත් එම වැය විෂය යටතේ වියදම් දැරීමේදී විචක්ෂණශීලී තොග කළමනාකරණය(Prudent Inventory Management), නිසි පරිදි ඖෂධ ගබඩාකරණය(proper storing of medicines),තත්කාලීන වෛද්‍ය සැපයුම් දත්ත සහිත ඒකාබද්ධ තොරතුරු පද්ධතිය(Integrated Medical Supply Information System) නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හා හදිසි මිළදී ගැනීම් සිදු නොවන පරිදි ප්‍රසම්පාදන කටයුතු වල ප්‍රමාදය අවම කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ.

03.ව්‍යවස්ථාපිත ආයතන

(අ) 1503 හා 1504 වැය විෂයන් යටතේ වෙන් වන ප්‍රතිපාදනවලින් වැටුප් හා වේතන අඩු කළ පසු ඉතිරි ප්‍රතිපාදනවලින් අවම වශයෙන් සියයට 6 කට සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි කිරීමට මෙම ව්‍යවස්ථාපිත ආයතන විසින් කටයුතු කළ යුතු වේ.එහිදී ඉහත 2 (අ) සිට (ඇ) දක්වා වන විධිවිධාන සහ පහත 4 හි උපදෙස් අනුගමනය කළ යුතු වේ.

(ආ) රැස් කරන අරමුදල් රඳවා තබා ගැනීම සඳහා අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මඟින් බලය ලැබී ඇති ව්‍යවස්ථාපිත ආයතන හැර අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන විසින් අය කරනු ලබන ගාස්තු හෝ රැස් කරනු ලබන **රජයේ ආදායම්** වහාම පළාත් අරමුදල වෙත මාරු කළ යුතුය.මෙම ආයතන සඳහා අවශ්‍ය අක් මුදල්, වාර්ෂික ඇස්තමේන්තුගත සීමාවට යටත්ව පළාත් භාණ්ඩාගාරය විසින් අවශ්‍යතාවය පරිදි සළසා දෙනු ලැබේ. එමෙන්ම, භාණ්ඩාගාරය විසින් මෙම ආයතන වෙත සළසා දෙනු ලබන මුදල්, තැන්පතු හෝ ආයෝජන ලෙස තබා ගැනීම සිදු නොකළ යුතුය.

04. පොදු උපදෙස්

(අ)ප්‍රදායක ආයතන විසින් පූර්ණ පිරිවැය දරනු නොලබන විදේශ අධ්‍යයන/පුහුණු /සාකච්ඡා/සම්මන්ත්‍රණ/සංචාර සඳහා දේශීය අරමුදල් මඟින් වියදම් දරමින් රජයේ නිළධාරීන් සහභාගී නොකළ යුතුය.

(ආ) පූර්ණ පිරිවැය, ප්‍රදායක ආයතන විසින් දරනු ලබන, විදේශ කටයුතු අමාත්‍යාංශය, හෝ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මාර්ගයෙන් රජයේ නිළධාරීන්ට හිමි වන හෝ විදේශ කටයුතු අමාත්‍යාංශයේ හෝ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිසි අනුමැතියක් සහිතව එළඹ ඇති ගිවිසුම්/සම්මුතීන් යටතේ රජයේ නිළධාරීන්ට හිමිවන හෝ ශ්‍රී ලංකාව විසින් එළඹ ඇති ගිවිසුම්/සම්මුතීන් යටතේ නිශ්චිත ආයතනයකට හිමි වන, විදේශ අධ්‍යයන/පුහුණු /සාකච්ඡා/සම්මන්ත්‍රණ/සංචාර සඳහා 2015.05.15 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2015/01 යටතේ අනියම් දීමනා පමණක් ලබා දිය හැක.

(ඇ) කාර්යමණ්ඩල පුහුණු සඳහා වන වියදම් යටතේ දේශීය පුහුණු අවස්ථා ලබා දීමේදී සේවා ව්‍යවස්ථා,බඳවා ගැනීමේ පටිපාටි හා චක්‍රලේඛ විධි විධාන අනුව, ඒ ඒ නිළධාරීන් විසින් සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු අනිවාර්ය පුහුණුවීම් සඳහා පමණක් එම පුහුණු අවස්ථා ලබා දිය යුතුවේ. එම පුහුණු කටයුතු පැවැත්වීම සඳහාම පිහිටුවා ඇති දේශීය ආයතන වෙත පමණක් නිළධාරීන් යොමු කළ යුතුය.ඉහත ගණයට නොගැනෙන සම්මන්ත්‍රණ,වැඩමුළු සහ සාමූහිකව නිළධාරීන් සඳහා සිදු කරන බාහිර යොමුගත පුහුණුවීම් (out bound trainings) යනාදිය වෙනුවෙන් රජයේ අරමුදල් භාවිතා නොකළ යුතුය.

ඉහත සඳහන් පරිදි ප්‍රතිපාදන අවුරා තැබීමෙන් පසු සංශෝධිත ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවා අරපිරිමැසුම්දායි ලෙස වියදම් දැරීමට හැකිවන සේ වියදම් අවශ්‍යතා ප්‍රමුඛතාගත කිරීමට කටයුතු කළයුතු වේ.

මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති අයවැය චක්‍රලේඛ අංක 01/2023 හි ඇතුලත් විධිවිධාන හා මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුව පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන සකසුරුවම් ලෙස වියදම් කළමණාකරණ ක්‍රමවේද ක්‍රියාත්මක වන බව තහවුරු කර ගැනිමට කටයුතු කළ යුතුවේ.

උද්ගතව පවත්නා අතිශය සීමාකාරී රාජ්‍ය මූල්‍ය අවකාශය තුල රජයේ වියදම් කළමණාකරණය සම්බන්ධයෙන් වූ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022, 08/2022 සහ 9/2022 මෙන්ම ජනාධිපති ලේකම්වරයා විසින් නිකුත් කරන ලද PS/SB/Circular/10/2022 හා 2022.08.15 දිනැති චක්‍රලේඛ උපදෙස් සහ මෙම චක්‍රලේඛයේ විධිවිධාන තරයේ ක්‍රියාත්මක කරන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් පෞද්ගලිකව සොයා බලා කටයුතු කළ යුතු බවද වැඩිදුරටත් අවධාරණය කරමි.

සුමිත් අලහකෝන්,

ප්‍රධාන ලේකම්,

දකුණු පළාත.

පිටපත් :-

1. ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති, දකුණු පළාත - දැ.ගැ.ස.
2. ලේකම්, මුදල් කොමිෂන් සභාව - දැ.ගැ.ස.
3. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ , දකුණු පළාත - අ.ක.ස.
4. ගිණුම් සහ ගෙවීම් අධ්‍යක්ෂ, දකුණු පළාත - අ.ක.ස.
5. මුදල් අධ්‍යක්ෂ, දකුණු පළාත - අ.ක.ස.

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: BD/CBP/01/01/05/2022
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.01. 27

28 JAN 2023

**අයවැය චක්‍රලේඛ අංක: 01/2023**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල ප්‍රධානීන්

**2023 වසර සඳහා වෙන් කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන සියයට 6 කින් කපා හැරීම හා රජයේ වියදම් කළමනාකරණය**

2023 වසර සඳහා ඇස්තමේන්තුගත රජයේ දළ ආදායම රැස්කිරීම සම්බන්ධයෙන් උද්ගතව ඇති දැඩි දුෂ්කරතා හේතුවෙන් ඇතිවිය හැකි අහිතකර ප්‍රතිවිපාක අවම කිරීම සඳහා රජයේ වියදම් වඩාත් අරපිරිමැසුම්දායී ලෙස භාවිතා කිරීම හා අත්‍යවශ්‍ය නොවන වියදම් හැකිතාක් අවම කිරීමේ අරමුණින් 2023 වර්ෂය සඳහා අයවැය මඟින් වෙන් කර ඇති පුනරාවර්තන වියදම්, අවම වශයෙන් සියයට 6 කින් කපා හැරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත. ඒ අනුව, සියලුම වියදම් ශීර්ෂවලට අදාළව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් පහත ක්‍රියාමාර්ගයන් අනුගමනය කළ යුතු වේ.

**02. සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු**

(අ) 2023 අයවැය ඇස්තමේන්තුවල පහත සඳහන් වැය විෂයයන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන හැර අනෙකුත් සියලුම පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදනවල එකතුවෙන් සියයට 6 කට සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් අවම වශයෙන් කපා හැරීම සඳහා සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් කටයුතු කළ යුතු වේ.

| | **වැය විෂය** | **වැය විෂය සංකේත අංකය** |
|---|---|---|
| (i) | වැටුප් හා වේතන | 1001 |
| (ii) | වෛද්‍ය සැපයුම් | 1204 |
| (iii) | බදු කුලී සහ පලාත් පාලන ආයතන බදු | 1404 |
| (iv) | විශ්‍රාමික ප්‍රතිලාභ | 1502 |
| (v) | දේශීය ණය සඳහා පොලී ගෙවීම් | 1601 |
| (vi) | විදේශ ණය සඳහා පොලී ගෙවීම් | 1602 |
| (vii) | භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම් | 1603 |
| (viii) | අත්‍යවශ්‍ය සුභසාධන ගෙවීම් (2(ඇ)vi අනුව) සහ ව්‍යවස්ථාපිත හෝ ගිවිසුම්ගත බැඳීම් | |

(ආ) වියදම් අවම කිරීම සඳහා හඳුනාගත් ක්‍රමවේද ද අඩංගු සංශෝධිත වියදම් ඇස්තමේන්තු, ඇමුණුම් 1 හි ඇති ආකෘතියට අනුකූලව 2023.02.28 දිනට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ විෂයභාර මාණ්ඩලික නිලධාරියා වෙත, ආවරණ ලිපියක් සහිතව විද්‍යුත් තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) වියදම් අවම කිරීම සඳහා නීතිරීති හා රෙගුලාසි දැඩිව පිළිපැදීම සහ ඒ ඒ ආයතනවල ස්වභාවය අනුව භාවිත කළ හැකි උපක්‍රමික ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ. පොදුවේ සියලු ආයතන විසින් පහත ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

(i). පවත්නා සම්පත් උපයෝගී කර ගනිමින්, ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය (Business Process Reengineering), ප්‍රශස්ත තොග කළමනාකරණය (Optimum Inventory Management), තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතය (Information Communication Technology), ඩිජිටල්කරණය (Digitalization), මාර්ගගත සේවා සැලසීම (On-line Service Delivery) ආදී ක්‍රමවේද හඳුන්වාදීම මඟින් තම ආයතනයන්හි පුනරාවර්තන/මෙහෙයුම් වියදම් අවම කිරීම සඳහා කටයුතු කළ යුතු ය.

(ii). විදුලිය, ජලය, දුරකථන සේවා, ඉන්ධන සහ අනෙකුත් ගිවිසුම් ගත සේවාවන් සඳහා වන වියදම් අවම කිරීම පිණිස උචිත වියදම් පාලන ක්‍රමවේද යොදා ගැනීම හා එම සේවා උපයෝජනය පිළිබඳ විගණනය කිරීම කළ යුතු ය. එමෙන්ම, කාර්යාලයීය අවශ්‍යතා මිලදී ගැනීම දැඩි පාලනයකට යටත් කළ යුතු වේ.

(iii). වැය විෂය සංකේතාංක 1002 - අතිකාල හා නිවාඩු දින වැටුප් සහ 1003 - වෙනත් දීමනා සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ද අවම වශයෙන් සියයට 6 කින් අඩු කළ යුතු බැවින් අතිකාල වියදම් දැඩි සේ පාලනය කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින්, අතිකාල හා නිවාඩු දින රාජකාරී කටයුතු සඳහා සත්‍ය සේවා අවශ්‍යතාවයක් පවතින බව හා අදාළ ගෙවීම් සඳහා හිමිකම් ලැබීමට සේවය කළ යුතු කාලය තුළ සත්‍ය වශයෙන්ම සේවයේ යෙදෙන බව, එම ගෙවීම් සඳහා බලය ලබා දෙන නිලධාරීන් විසින් අනිවාර්යයෙන්ම තහවුරු කර ගත යුතු වේ. එමෙන්ම, නිසි අධිකාරී බලයක් නොමැතිව අමාත්‍යාංශ හෝ ආයතන මට්ටමින් නිකුත් කරනු ලබන අභ්‍යන්තර උපදෙස් මත ගෙවනු ලබන දීමනා නතර කළ යුතු වේ.

(iv). වැය විෂය සංකේතාංක 1202 - ඉන්ධන, 1401 - ප්‍රවාහන හා 1408 - මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා වාරික ගෙවීම් සම්බන්ධයෙන් වන වියදම් පාලනය සඳහා නිල වාහන හිමි නිලධාරීන්ට අනුයුක්ත කිරීම සඳහා ප්‍රමාණවත් වාහන ආයතනයේ සංචිත වාහන ලෙස පවතින අතරතුරදී, එම නිලධාරීන් වෙත අනුයුක්ත කිරීම සඳහා කුලී පදනම මත වාහන ලබා ගැනීම නොකළ යුතු ය. නිල වාහන අනුයුක්ත කිරීමේදී මෙන්ම භාවිතයේදී අනුමත නිල වාහන හිමිකම අනුව එක් වාහනයක් පමණක්, අනුමත ඉන්ධන සීමාව තුළ භාවිතා කරනු ලබන බවට හා නිල වාහන හිමි/නිල වාහන වෙනුවට මාසික ප්‍රවාහන දීමනාව ලබාගන්නා නිලධාරීන් වෙත කිසිදු අවස්ථාවකදී සංචිත වාහන ලබා නොදෙන බවට තහවුරු කරගෙන කටයුතු කිරීම, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමකි.

(v). සංචිත වාහන භාවිතයද, මනා සැලසුමකින් යුතුව, අත්‍යවශ්‍යම කටයුතු සඳහා පමණක් සීමා කිරීමටත්, මාර්ගගත ක්‍රමවේද (online methods) හැකිතාක් භාවිතා කරමින් රැස්වීම්/සම්මන්ත්‍රණ/සාකච්ඡා පැවැත්වීම තුළින් ප්‍රවාහන අවශ්‍යතා පැන නැගීම සීමා කිරීමටත්, කටයුතු කළ යුතු ය. එමෙන්ම, කලාප/ප්‍රාදේශීය/උප-කාර්යාල මගින් පහසුවෙන් ආවරණය කළ හැකි රාජකාරී/සේවා අවශ්‍යතා වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් ප්‍රවාහන පහසුකම් සඳහා වියදම් දරමින් කටයුතු කිරීම අවම කළ යුතු ය.

(vi). මෙම චක්‍රලේඛය මගින් අරමුණු කරනු ලබන ප්‍රතිපාදන කපා හැරීම් පහත සුභසාධන වියදම් සඳහා අදාළ නොවේ.

- දුෂ්කර ආර්ථික වාතාවරණය හමුවේ පීඩාවට පත් පුද්ගලයන් සඳහා සහන සැලසීම
- සමෘද්ධි, වැඩිහිටි, වකුගඩු රෝගීන් සඳහා දීමනා සහ ආබාධ සහිත පුද්ගලයන් සඳහා දීමනා
- ගර්භනී මවුවරුන් සඳහා පෝෂණ ආහාර පැකේජය, පෙර පාසැල් ළමුන් සඳහා උදෑසන ආහාරය, උග්‍ර මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන්ට පෝෂණ අතිරේකය
- ත්‍රිපෝෂ වැඩසටහන, පාසල් පෝෂණ වැඩසටහන ඇතුළු පාසල් සඳහා වන සුභසාධන වැඩසටහන්

එසේ වුවද, වැය විෂය සංකේතාංක 1501 යටතේ වන සුභසාධන වැඩසටහන්වල ප්‍රතිපාදන, ඉහත 2(ඈ) (I) හි සඳහන් නව ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම තුළින් හා ප්‍රතිලාභීන් "ඉලක්කගත කිරීමේ කාර්යක්ෂමතාවය" ඉහළ නැංවීම තුළින් ඉතිරි කිරීමට කටයුතු කළ යුතු වේ.

(vii). ඉතිරි කිරීම් ගණනය කිරීමේදී වැය විෂය සංකේතාංක අංක 1204 - වෛද්‍ය සැපයුම් නිදහස් කර ඇතත්, එම වැය විෂය යටතේ වියදම් දැරීමේදී විචක්ෂණශීලී තොග කළමනාකරණය (Prudent Inventory Management), නිසි පරිදි ඖෂධ ගබඩාකරණය (proper storing of medicines), තත්කාලීන වෛද්‍ය සැපයුම් දත්ත සහිත ඒකාබද්ධ තොරතුරු පද්ධතිය (Integrated Medical Supply Information System) නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හා හදිසි මිලදී ගැනීම් සිදු නොවන පරිදි ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රමාදය අවම කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ.

(viii). රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ මාණ්ඩලික නිලධාරීන් වෙත ලබා දෙන ණය පහසුකම් සම්බන්ධයෙන් ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 හි පවතින සීමාවන් තවදුරටත් එලෙසින්ම ක්‍රියාත්මක වේ.

## 3. පළාත් සභා

වැය විෂය සංකේතාංක 1507 - පළාත් සභා සඳහා ප්‍රදානයන්ට අදාලව ප්‍රතිපාදන කපා හැරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ඇත.

## 4. රජයේ අයවැයෙන් මූල්‍යනය වන ව්‍යවස්ථාපිත ආයතන

(අ) 1503 වැය විෂය යටතේ වෙන් වන ප්‍රතිපාදනවලින් වැටුප් හා වේතන අඩු කළ පසු ඉතිරි ප්‍රතිපාදනවලින් සහ 1509 වැය විෂය යටතේ වෙන් වන ප්‍රතිපාදනවලින් අවම වශයෙන් සියයට 6 කට සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි කිරීමට මෙම ව්‍යවස්ථාපිත ආයතන විසින් කටයුතු කළ යුතු වේ. එහිදී ඉහත 2 (අ) සිට (ඈ) දක්වා වන විධිවිධාන සහ පහත 6 හි උපදෙස් අනුගමනය කළ යුතු වේ. මේ අනුව, සංශෝධනය කරනු ලබන වියදම් ඇස්තමේන්තු, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව, 2023.02.28 දිනට ප්‍රථම අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. (ඇමුණුම් 1 හි සඳහන් ආකෘති පත්‍රය සුදුසු පරිදි සංශෝධනය කර මේ කාර්යය සඳහා යොදා ගත හැකිය).

(ආ) රැස්කරන අරමුදල් රඳවා තබා ගැනීම සඳහා අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මගින් බලය ලැබී ඇති ව්‍යවස්ථාපිත ආයතන හැර අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන විසින් අය කරනු ලබන ගාස්තු හෝ රැස් කරනු ලබන **රජයේ ආදායම්** වහාම ඒකාබද්ධ අරමුදල වෙත මාරු කළ යුතු ය. මෙම ආයතන සඳහා අවශ්‍ය අක්මුදල්, වාර්ෂික ඇස්තමේන්තුගත සීමාවට යටත්ව භාණ්ඩාගාරය විසින් අවශ්‍යතාවය පරිදි සලසා දෙනු ලැබේ. එමෙන්ම, භාණ්ඩාගාරය විසින් මෙම ආයතන වෙත සලසා දෙනු ලබන මුදල්, තැන්පතු හෝ ආයෝජන ලෙස තබා ගැනීම සිදු නොකළ යුතු ය.

## 5. රජයේ අයවැයෙන් මූල්‍යනය නොවන ව්‍යවස්ථාපිත ආයතන

අංක 23/0100/604/007 දරන 2023.01.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය බැංකු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය සමාගම් සහ අනෙකුත් රාජ්‍ය ව්‍යාපාරයන්හි 2023 වර්ෂය සඳහා අනුමත අයවැය ඇස්තමේන්තුවල පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රතිපාදනවලින් සියයට 6 ක් අවුරා තැබීම මගින් වියදම් අඩු කර ගැනීම පිණිස වන උපදෙස්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ඇත.

## 6. පොදු උපදෙස්

(අ). ප්‍රදායක ආයතන විසින් පූර්ණ පිරිවැය දරනු නොලබන විදේශ අධ්‍යයන/ පුහුණු/ සාකච්ඡා/ සම්මන්ත්‍රණ/ සංචාර සඳහා දේශීය අරමුදල් මගින් වියදම් දරමින් රජයේ නිලධාරීන් සහභාගී නොකළ යුතු ය.

(ආ) පූර්ණ පිරිවැය, ප්‍රදායක ආයතන විසින් දරනු ලබන, විදේශ කටයුතු අමාත්‍යාංශය, හෝ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මාර්ගයෙන් රජයේ නිලධාරීන්ට හිමිවන හෝ විදේශ කටයුතු අමාත්‍යාංශයේ හෝ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිසි අනුමැතියක් සහිතව එළඹ ඇති ගිවිසුම්/සම්මුතීන් යටතේ රජයේ නිලධාරීන්ට හිමිවන හෝ ශ්‍රී ලංකාව විසින් එළඹ ඇති ගිවිසුම්/සම්මුතීන් යටතේ නිශ්චිත ආයතනයකට හිමිවන, විදේශ අධ්‍යයන/පුහුණු/සාකච්ඡා/සම්මන්ත්‍රණ/සංචාර සඳහා 2015.05.15 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2015/01 යටතේ අනියම් දීමනා පමණක් ලබා දිය හැක.

(ඇ) කාර්යමණ්ඩල පුහුණු සඳහා වන වියදම් යටතේ දේශීය පුහුණු අවස්ථා ලබාදීමේදී සේවා ව්‍යවස්ථා, බඳවාගැනීමේ පටිපාටි හා චක්‍රලේඛ විධිවිධාන අනුව, ඒ ඒ නිලධාරීන් විසින් සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු අනිවාර්ය පුහුණුවීම් සඳහා පමණක් එම පුහුණු අවස්ථා ලබා දිය යුතු වේ. එම පුහුණු කටයුතු පැවැත්වීම සඳහාම පිහිටුවා ඇති දේශීය ආයතන වෙත පමණක් නිලධාරීන් යොමු කළ යුතු ය. ඉහත ගණයට නොගැනෙන සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සාමූහිකව නිලධාරීන් සඳහා සිදු කරන බාහිර යොමුගත පුහුණුවීම් (out bound trainings) යනාදිය වෙනුවෙන් රජයේ අරමුදල් භාවිතා නොකළ යුතු ය.

(ඈ) ඉහත සඳහන් පරිදි ප්‍රතිපාදන කපා හැරීමෙන් පසු සංශෝධිත ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවා අරපිරිමැසුම්දායී ලෙස වියදම් දැරීමට හැකි වන සේ වියදම් අවශ්‍යතා ප්‍රමුඛතාගත කිරීමට කටයුතු කළ යුතු වේ.

(ඉ) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා සියලු රාජ්‍ය ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී මෙම චක්‍රලේඛයේ විධිවිධාන සහ සකසුරුවම් ලෙස වියදම් කළමනාකරණය කිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක වන බව තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු අතර අවශ්‍ය අවස්ථාවලදී නිසි උපදෙස් ලබා දිය යුතු ය.

**7**. උද්ගතව පවත්නා අතිශය සීමාකාරී රාජ්‍ය මූල්‍ය අවකාශය තුළ රජයේ වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් වූ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022, 08/2022, සහ 09/2022 මෙන්ම ජනාධිපති ලේකම්වරයා විසින් නිකුත් කරන ලද PS/SB/Circular/10/2022 හා 2022.08.15 දිනැති චක්‍රලේඛ උපදෙස් සහ මෙම චක්‍රලේඛයේ විධිවිධාන තරයේ ක්‍රියාත්මක කරන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් පෞද්ගලිකව සොයා බලා කටයුතු කළ යුතු බව ද අවධාරණය කරමි.

**කේ. එම්. මහින්ද සිරිවර්ධන**
**භාණ්ඩාගාර ලේකම්**

**පිටපත්:**

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, මුදල් කොමිෂන් සභාව

# මුදල් කොමිෂන් සභාව

(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 "ඊ" ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලදී)

# நிதி ஆணைக்குழு

(அரசியலமைப்பின் 154 "ஈ" ஆம் உறுப்புரையின் கீழ் தாபிக்கப்பட்டது)

# FINANCE COMMISSION

(Established under Article 154 "R" of the Constitution)

03, සරණ මාවත,
රාජගිරිය, ශ්‍රී ලංකාව.

இல. 03, சரண மாவத்தை,
ராஜகிரிய, இலங்கை.

03, Sarana Mawatha,
Rajagiriya, Sri Lanka.


(4)

මගේ අංකය / எனது இல. / My No.: FC/RCA/GEN/06/01/2023 Voi. I

ඔබේ අංකය / உமது இல. / Your No.:

07 FEB 2023

දිනය / திகதி / Date: 2023.02.03

ප්‍රධාන ලේකම්,

බස්නාහිර, මධ්‍යම, දකුණු, උතුරු, වයඹ, උතුරු මැද, ඌව, සබරගමුව, නැගෙනහිර පළාත.

**2023 වසර සඳහා වෙන් කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන සියයට 6 කින් කපා හැරීම හා රජයේ වියදම් කළමනාකරණය**

උක්ත කරුණ සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද අංක BD/CBP/01/01/05/2022 හා 2023.01.27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 හා බැඳේ. (එහි පිටපතක් මේ සමග අමුණා ඇත)

02. 2023 වසර සඳහා ඇස්තමේන්තුගත රජයේ දළ ආදායම රැස් කිරීම සම්බන්ධයෙන් උද්ගතව ඇති දැඩි දුෂ්කරතා හේතුවෙන් ඇති විය හැකි අහිතකර ප්‍රතිවිපාක අවම කිරීම සඳහා වඩාත් ඵලදායී හා අරපිරිමැසුම්දායී ලෙස රජයේ අරමුදල් යෙදවීම මෙහිදී අවධාරණය කරනු ලැබේ. ඉහත අරමුණින් 2023 වර්ෂය සඳහා අයවැය මගින් වෙන් කර ඇති පුනරාවර්තන වියදම් අවම වශයෙන් 6% කින් අඩුරා තැබීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත.

03. එබැවින්, ඔබ පළාත් සභාව විසින් දරන වියදම් සඳහා ද උක්ත චක්‍රලේඛයට අනුගතව කටයුතු කරන මෙන් ඔබ වෙත කාරුණිකව දන්වමි.

ජේ.ටී.එම්.ශූ.ඩී.බී.තෙන්නකෝන්
ලේකම්
මුදල් කොමිෂන් සභාව

පිටපත් :-

i. ජනාධිපති ලේකම්
ii. අග්‍රාමාත්‍ය ලේකම්
iii. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
iv. විගණකාධිපති
v. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

} කා.දැ.ගැ.පි.


සභාපති / தலைவர் / Chairman (+94)011 2866724
කාර්යාලය / அலுவலகம் / Office (+94)011 2866747
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.fincom.gov.lk
ලේකම් / செயலாளர் / Secretary (+94)011 2866824
ෆැක්ස් / தொலைநகல் / Fax (+94)011 2866679
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail info@fincom.gov.lk

ඇමුණුම 1

## 2023 වියදම් ඉතිරි කිරීම පිළිබඳ විස්තර

වැය ශීර්ෂය :

වැඩසටහන :

ව්‍යාපෘතිය :

| වැය විෂය | 2023 ඇස්තමේන්තුව (රු. මිලියන) | යෝජිත ඉතිරි කිරීම් (රු. මිලියන) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තු (රු. මිලියන) | ඉතිරි කිරීම සඳහා අපේක්ෂිත පියවර/හඳුන්වාදෙනු ලබන නව ක්‍රමවේද |
|---|---|---|---|---|
| | | | | උදා:<br>1. ප්‍රශස්ත තොග කළමනාකරණය<br>2. මාර්ගගත සේවා සැලසුම<br>3. ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය |
| **එකතුව** | | | | |

දිනය: ප්‍රධාන ගණන්දීමේ නිලධාරී /ගණන්දීමේ නිලධාරීගේ අත්සන